# වයෝවෘද්ධ පුද්ගලයන්ගේ ආර්ථික ගැටලු විසඳීමෙහි ලා බුදුසමයාගත සමජීවිකතා සංකල්පයෙහි උපයෝගිතාව

තබ්බෝවේ කාරුණික හිමි[1], යූ. එස්. වර්ණකුලසූරිය[2], යූ.එස්. ඉන්දීවරී කරුණානායක[3]

## හැඳින්වීම

ලෝක සෞඛ්‍ය සංවිධානයේ දත්ත අනුව 2050 වන විට ලෝක ජනගහනයෙන් සියයට 22ක් පමණ අවුරුදු 60ට වැඩි වයස්ගත පුද්ගලයන් වනු ඇතැයි අනාවැකි පළ වී ඇත. ශ්‍රී ලංකාව ආසියාවේ වේගවත්ම වයෝවෘද්ධිකරණයට ලක්වන රටවලින් එකක් වන අතර, ජනගහන සංක්‍රමණය සමඟින් සාම්ප්‍රදායික පවුල් පාදක සැලකිලිමත් වීමේ ක්‍රමවේදය ක්‍රමයෙන් දුර්වල වෙමින් පවතී. මෙම තත්ත්වය තුළ වයෝවෘද්ධ පුද්ගලයන් තමන්ගේම ආර්ථික සුරක්ෂිතතාව සම්බන්ධයෙන් වැඩි වගකීමක් දැරීමට සිදුවී ඇත. එහෙත් විශ්‍රාම වැටුප් ක්‍රමවේද අසම්පූර්ණ වීම, අවිධිමත් අංශයේ සේවා නියුක්තිකයන්ට විශ්‍රාම ප්‍රතිලාභ නොමැති වීම, සෞඛ්‍ය සේවා වියදම් ඉහළ යාම හා උද්ධමනය හේතුවෙන් ඉතිරි කිරීම් අවස්ථා අඩුවීම වැනි සාධක නිසා වයෝවෘද්ධ ප්‍රජාවගේ ආර්ථික කළමනාකරණය සංකීර්ණ අභියෝගයක් බවට පත්වී ඇත. මෙවැනි සන්දර්භයක් තුළ, ධනවාදී ආර්ථික න්‍යායන් ආර්ථික ගැටලු විසඳීම සඳහා ප්‍රධාන වශයෙන් යොමු කරන්නේ ආදායම් වර්ධනය, ආයෝජන ප්‍රතිලාභ හා වෙළඳපොළ පදනම් වූ විසඳුම් වෙතය. එහෙත් වයෝවෘද්ධ පුද්ගලයෙකුට නව ආදායම් මාර්ග විවෘත කර ගැනීමේ හැකියාව සීමිත වන බැවින්, පවතින සම්පත් සමතුලිතව හා විචක්ෂණශීලීව කළමනාකරණය කිරීමේ ප්‍රවේශයක් අවශ්‍ය වේ. බුදුදහමේ ආර්ථික දර්ශනය මෙහිදී විශේෂ අවධානයට ලක්කළ හැකිය. ධනය රැස්කිරීම හෝ පරිභෝජනය සීමාව ඉක්මවා සිදු කිරීම මූලික අරමුණු ලෙස නොසලකා, 'මධ්‍යස්ථ ප්‍රතිපදාව' පදනම් කරගත් ජීවන ක්‍රමයක් යෝජනා කරන බැවිනි. මෙම ලිපියේ මූලික අවධානය යොමු වන්නේ ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ (අංගුත්තර නිකාය) දැක්වෙන සමජීවිකතා හෙවත් සමජීවිකත්ව සංකල්පය ආදායමට අනුරූපව වියදම් සමතුලිත කිරීමේ මූලධර්මය වයෝවෘද්ධ ආර්ථික කළමනාකරණ ගැටලුවලට ප්‍රායෝගිකව අදාළ කරගත හැකි ආකාරය පිළිබඳවය.

## පර්යේෂණ ගැටලුව

වයෝවෘද්ධ පුද්ගලයන්ගේ ආර්ථික කළමනාකරණ ගැටලුවලට බෞද්ධ ආර්ථික විද්‍යාත්මක මැදිහත්වීම්හි ඇතුළත් සමජීවිකතා සංකල්පය උපයෝගී කර ගත හැක්කේ කවරාකාරයෙන් ද? යන්න මෙහි පර්යේෂණ ගැටලුව වේ.

1 පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය, karunikathero@gmail.com
2 පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය. warnakulasooriyasankalpanee@gmail.com
3 පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය, saleelakarunanayaka@gmail.com

## ක්‍රමවේදය

ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය ඔස්සේ ප්‍රාථමික මූලාශ්‍රය වශයෙන් සූත්‍ර පිටකය හා ද්විතීයික මූලාශ්‍රය ලෙස බෞද්ධ උපදේශනය, බෞද්ධ ආර්ථික දර්ශනය සම්බන්ධව රචිත ශාස්ත්‍රීය ග්‍රන්ථ, ලිපි, ලේඛන ඇසුරෙන් මෙම අධ්‍යයනය සිදුවිය.

## ප්‍රතිඵල

'බෞද්ධ ආර්ථික විද්‍යාව' යන යෙදුම නූතන අර්ථයෙන් ජනප්‍රිය කරන ලද්දේ අර්න්ස්ට් ෆ්‍රිඩ්රික් ෂුමාකර් විසින් 1966 දී ලියන ලද ලිපියක් ඇසුරෙනි. ඔහුගේ අදහස වූයේ, බුදුදහමේ නිවැරදි ජීවනෝපායක් (සම්මා ආජීව) පදනම් කරගත් ආර්ථික ක්‍රියාකාරකම් හුදු භෞතික ධනය උපරිම කිරීම නොව, දුක් නැති කිරීම හා යහපත් ජීවිතයක් සඳහා අවශ්‍ය සම්පත් සුමට ලෙස කළමනාකරණය කිරීම බවයි. පසුව තායිලන්ත භික්ෂුවක් වන පායුත්තෝ හිමියන් 'බෞද්ධ ආර්ථික විද්‍යාව: වෙළඳපොළට මධ්‍යස්ථ ප්‍රවේශයක්' නමැති කෘතියෙන් මෙම න්‍යාය තවදුරටත් විස්තාරණය කරමින්, ආර්ථික ක්‍රියාකාරකම් තුළ 'ප්‍රඥාවෙන් යුත් පරිභෝජනය' සහ 'අවශ්‍යතාව' සහ 'ආශාව' අතර වෙනස හඳුනාගැනීමේ අවශ්‍යතාව අවධාරණය කළේය. මෙම න්‍යායික පදනම මත, ආර්ථික තෘප්තිය යනු පරිභෝජනයේ ප්‍රමාණයෙන් නොව, එහි ගුණාත්මකභාවයෙන් හා සමතුලිතතාවයෙන් තීරණය වන බව පැහැදිලි වේ.

අංගුත්තර නිකායේ ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේදී බුදුරජාණන් වහන්සේ දීඝජාණු කෝලිය පුත්‍රයාට මෙලොව සුවය සඳහා අවශ්‍ය සම්පත් සතරක් දේශනා කළහ.

- උට්ඨාන සම්පදා - ශිල්පීය දැනුමෙන් හා කැපවීමෙන් යුතුව ජීවනෝපාය ඉටු කිරීම
- ආරක්ඛ සම්පදා - මහන්සියෙන් උපයන ලද ධනය සුරක්ෂිතව රැක ගැනීම
- කල්‍යාණමිත්තතා - යහපත් හා විශ්වාසවන්ත මිත්‍ර සබඳතා පවත්වා ගැනීම, එමගින් අවිචාරී වියදම් වළක්වා ගැනීම
- සමජීවිකතා (සමජීවිකත්ව) - ආදායමට අනුරූපව වියදම් සමතුලිත කිරීම; අනවශ්‍ය වියදම් වලින් යුක්ත වීම හා අධික මසුරුබව යන අන්තවලින් තොර මධ්‍යස්ථ ජීවන මාර්ගයක් අනුගමනය කිරීම

මෙම චතුර්විධ සම්පත් අතරින් සමජීවිකතාව විශේෂ වැදගත්කමක් උසුලයි. සමජීවිකතාව යනු තමන්ගේ ආදායම හා වියදම මැනවින් දැනගෙන, ආදායම ඉක්මවා නොයන ලෙසත්, අත්‍යවශ්‍ය අවශ්‍යතා නොසලකා හරිමින් අධික ලෙස මසුරු නොවන ලෙසත් මධ්‍යස්ථව ජීවත් වීමයි. ව්‍යග්ඝපජ්ජ (දීඝජානු) සූත්‍රයේදී බුදුරජාණන් වහන්සේ පෙන්වා දෙන්නේ ආදායම ඉක්මවා වියදම් කිරීම පුද්ගලයාගේ භෝග පිරිහීමට හේතුවන බවත්, ධනය නිවැරදි ලෙස ප්‍රයෝජනයට නොගෙන අතිශයින් මසුරු ලෙස ජීවත් වීම ද සුදුසු නොවන බවත්ය. එබැවින් සමජීවිකතාව යනු අනවශ්‍ය වියදම්වලින් තොර වීම සහ අධික මසුරුකම යන අන්ත දෙකම බැහැර කරමින්, ආදායමට සරිලන පරිදි සමානුපාතික හා විචක්ෂණශීලී ජීවන රටාවක් පවත්වාගෙන යාමේ බෞද්ධ ආර්ථික මූලධර්මයක් ලෙස හැඳින්විය හැකිය.

වයෝවෘද්ධ පුද්ගලයෙකුගේ ආදායම සාමාන්‍යයෙන් සීමිත හා ස්ථාවර වන අතර, එය තවදුරටත් වර්ධනය කිරීමේ අවස්ථා අවම බැවින්, සමජීවිකතා මූලධර්මය අනුව ප්‍රමුඛතාවය ලැබිය යුත්තේ ආදායමට අනුරූපව වියදම් සීමා කිරීම මිස ආදායම වර්ධනය කිරීම නොවේ. මෙය ප්‍රායෝගිකව අදාළ කරගත හැක්කේ,

දෛනික අත්‍යවශ්‍ය වියදම් (ආහාර, නිවාස ආදී) සඳහා ස්ථාවර මූල්‍ය සීමාවක් නියම කිරීම

සෞඛ්‍ය අවශ්‍යතා සඳහා අනාගත සැලසුම් සහිත වෙන් කිරීමක් සිදුකිරීම

සමාජීය හා ආගමික කටයුතු සඳහා වන වියදම් පවා මධ්‍යස්ථව සීමා කිරීම යනාදී ලෙසිනි.

ආරක්ඛ සම්පදා මූලධර්මය අනුව, විශ්‍රාම වයසට පෙර රැස් කරගත් ධනය අනවශ්‍ය ආයෝජනවලින් ආරක්ෂා කර ගැනීම වැදගත් වේ. සමජීවිකතා සංකල්පය මෙහිදී ආරක්ඛ සම්පදාව සමඟ අන්තර්ක්‍රියා කරමින්, ඉතුරුම් හා වියදම් අතර සමතුලිතතාවයක් පවත්වා ගැනීමට උපදෙස් දෙයි. එනම්, සියලු ධනය එකවර වියදම් නොකර, එමෙන්ම අවශ්‍යතා පවා නොසලකා අධික ලෙස රැස් නොකර, ක්‍රමානුකූලව හා විචක්ෂණශීලීව භාවිත කිරීමයි. බෞද්ධ දර්ශනය තුළින් එයට සදාචාරාත්මක හා මානසික සන්සුන්භාවයේ මානයක් එකතු වේ.

කල්‍යාණමිත්තතා මූලධර්මය වයෝවෘද්ධ ආර්ථික සුරක්ෂිතතාවයට අදාළ වන්නේ, විශ්වාසවන්ත පවුල් සාමාජිකයන් හා සමාජ ජාල හරහා ආර්ථික තොරතුරු හුවමාරුව, අනවශ්‍ය මූල්‍ය රැවටීම් වළක්වා ගැනීම හා අන්‍යෝන්‍ය ආධාර ලබා ගැනීම හරහාය. ග්‍රාමීය ශ්‍රී ලංකාවේ පවතින සාම්ප්‍රදායික සමූහ ඉතුරුම් ක්‍රමවේද, කල්‍යාණමිත්තතා හා සමජීවිකතා යන මූලධර්ම දෙකම එකට ක්‍රියාත්මක වන ප්‍රායෝගික උදාහරණයකි. මන්ද එහිදී පුද්ගලයෙකුගේ මධ්‍යස්ථ ඉතුරුම් හැකියාව විශ්වාසවන්ත සමාජ ජාලයක් තුළින් ශක්තිමත් වන බැවිනි.

නූතන වෙළඳ දැන්වීම් හා පාරිභෝගික සංස්කෘතිය තුළ, වයෝවෘද්ධ පුද්ගලයන් පවා අනවශ්‍ය පරිභෝජනයට ලක් වීමේ අවදානමක් පවතී. සෞඛ්‍ය ආශ්‍රිත නිෂ්පාදන, අතිරේක ඖෂධ, හෝ 'ආරක්ෂාව' යනුවෙන් අලෙවි කරන අධික මිල අයකරන රක්ෂණාවරණ මෙහිලා විශේෂයෙන් පෙන්වා දිය හැකිය. මෙහිදී සමජීවිකතා සමඟ එකට යෙදිය හැක්කේ, යථාර්ථවාදී අවශ්‍යතාවයන් හඳුනාගෙන, ඒවා සඳහා පමණක් වියදම් සීමා කිරීමට මගපෙන්වීමකි. මෙය හුදු මුදල් ඉතිරි කිරීමක් නොව, තෘෂ්ණාව පාලනය කිරීම හරහා මානසික සුවතාවය ද වර්ධනය කරන ප්‍රවේශයකි.

පහත වගුවෙන් සමජීවිකතා සංකල්පය හා නූතන මූල්‍ය සැලසුම්කරණ ප්‍රවේශයන් අතර මූලික සමානතා හා වෙනස්කම් සංසන්දනය කෙරේ.

| මානය | නූතන මූල්‍ය සැලසුම්කරණය | සමජීවිකතා (බෞද්ධ) ප්‍රවේශය |
|---|---|---|
| මූලික අරමුණ | ධන වර්ධනය හා ලාභ උපරිමකරණය | වියදම් හා ආදායම් අතර මධ්‍යස්ථ සමතුලිතතාව |
| තීරණ ගැනීමේ පදනම | ගුණාත්මක විශ්ලේෂණ, වෙළඳපොළ අනාවැකි | ප්‍රඥාව, විචක්ෂණශීලීත්වය, තෘප්තිය |
| අවදානම් කළමනාකරණය | විවිධාංගීකරණය, රක්ෂණය | ආරක්ඛ සම්පදාව, මධ්‍යස්ථ ඉතුරුම් |
| සමාජීය මානය | සීමිත / ආයතනගත | කල්‍යාණමිත්තතාව හරහා පවුල්/ප්‍රජා සහයෝගීතාව |
| සාර්ථකත්වයේ මිනුම | ධන ප්‍රමාණය | මානසික සුවතාවය හා ජීවන තෘප්තිය |

**සාකච්ඡාව**

ඉහත විශ්ලේෂණයෙන් පැහැදිලි වන්නේ, සමජීවිකතා සංකල්පය හුදෙක් ‘අඩුවෙන් වියදම් කරන්න’ යන සරල උපදෙසකට සීමා නොවන බවයි. එය ආදායම, වියදම, ඉතුරුම් හා සමාජ සබඳතා යන සියලු අංශ එකට බැඳගත් සමස්ත ජීවන දර්ශනයකි. නූතන මූල්‍ය සැලසුම්කරණ ආකෘති බොහෝ විට වයෝවෘද්ධ පුද්ගලයන්ට සංකීර්ණ ආයෝජන තීරණ ගැනීමට බලකරන අතර, එය මූල්‍ය සාක්ෂරතාවය අඩු පිරිසකට එතරම් ප්‍රායෝගික නොවිය හැක. සමජීවිකතා ප්‍රවේශය, ඊට වඩා සරල, පවතින සම්පත් සමතුලිතව භාවිත කිරීම කේන්ද්‍ර කරගත් ආකෘතියක් ලෙස, විශේෂයෙන් අවිධිමත් ආදායම් ප්‍රභවයන් මත යැපෙන වයෝවෘද්ධ පිරිසකට වඩාත් ප්‍රවේශ විය හැකි විසඳුමක් සපයයි.

එහෙත් මෙම ප්‍රවේශයේ සීමාවන් ද හඳුනාගත යුතුය. පළමුව, සමජීවිකතා සංකල්පය ප්‍රමාණාත්මක මෙවලමක් නොව ගුණාත්මක මාර්ගෝපදේශයක් වන බැවින්, එය ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීම සඳහා නවීන අයවැය සැලසුම් ක්‍රමවේද සමඟ ඒකාබද්ධ කිරීම අවශ්‍ය වේ. දෙවනුව, අන්ත දරිද්‍රතාවයෙන් පෙළෙන වයෝවෘද්ධ පුද්ගලයන් සම්බන්ධයෙන් ‘මධ්‍යස්ථභාවය’ යන සංකල්පයම ප්‍රායෝගික නොවිය හැකි අතර, එවැනි අවස්ථාවලදී රාජ්‍ය මට්ටමේ සමාජ ආරක්ෂණ ජාල අත්‍යවශ්‍ය වේ. එබැවින් සමජීවිකතා ප්‍රවේශය රාජ්‍ය ප්‍රතිපත්තිවලට ආදේශකයක් නොව, ඒවාට අනුපූරක වන පුද්ගල මට්ටමේ ආචාරධර්මානුකූල ව මාර්ගෝපදේශයක් ලෙස වටහාගත යුතුය.

**නිගමනය සහ නිර්දේශ**

මෙම විශ්ලේෂණයෙන් පැහැදිලි වන්නේ, බුදුදහමේ සමජීවිකතා සංකල්පය වයෝවෘද්ධ ආර්ථික කළමනාකරණ ගැටලුවලට සදාචාරාත්මකව හා ප්‍රායෝගිකව අදාළ විය හැකි විකල්ප දර්ශනයක් සපයන බවයි. ආදායමට අනුරූපව වියදම් සමතුලිත කිරීම, ආරක්ෂිත ඉතුරුම් හැසිරීම්, විශ්වාසවන්ත සමාජ සබඳතා පවත්වා ගැනීම හා ප්‍රඥාවෙන්

යුත් පරිභෝජනය යන මූලධර්ම හතරම එකට ක්‍රියාත්මක වන විට, වයෝවෘද්ධ පුද්ගලයෙකුට සීමිත සම්පත් තුළ පවා තෘප්තිමත් හා සුරක්ෂිත ජීවිතයක් ගත කිරීමට හැකියාව ලැබේ. මේ අනුව පහත නිර්දේශ ඉදිරිපත් කළ හැකිය.

- වයෝවෘද්ධ ප්‍රජාව ඉලක්ක කරගත් මූල්‍ය සාක්ෂරතා වැඩසටහන් සමජීවිකතා මූලධර්මය පදනම් කරගෙන සකස් කිරීම
- ග්‍රාමීය සමූහ ඉතුරුම් ක්‍රමවේද නවීකරණය කරමින් රාජ්‍ය මට්ටමින් ප්‍රවර්ධනය කිරීම
- පන්සල් හා ආගමික ආයතන, වයෝවෘද්ධ ආර්ථික උපදේශන සේවාවක් සඳහා ප්‍රජා මධ්‍යස්ථාන ලෙස යොදාගැනීම
- සමජීවිකතා ප්‍රවේශය රාජ්‍ය සමාජ ආරක්ෂණ ප්‍රතිපත්තිවලට ආදේශකයක් ලෙස නොව, ඒවාට අනුපූරකයක් ලෙස ඒකාබද්ධ කිරීම

මේ අනුව බෞද්ධ ආර්ථික විද්‍යාව යනු, අතීත උරුමයක් පමණක් නොව, සමකාලීන ආර්ථික අභියෝගවලට, විශේෂයෙන් ජනගහන වයෝවෘද්ධිකරණමය වැනි ගෝලීය ප්‍රවණතාවලට ප්‍රතිචාර දැක්වීමට හැකි සජීවී දර්ශනයක් බව මෙම විශ්ලේෂණයෙන් පැහැදිලි වේ.

**ප්‍රමුඛ පද** - බෞද්ධ ආර්ථික දර්ශනය, ව්‍යග්ඝපජ්ජ සූත්‍රය, වෘද්ධත්ව අවධිය, වෘද්ධත්ව කළමනාකරණය, සමජීවිකතා

## ආශ්‍රිත ග්‍රන්ථ

### ප්‍රාථමික මූලාශ්‍රය

*අංගුත්තරනිකාය*, (2006). දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

*මජ්ඣිමනිකාය*, (2006). දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

*සංයුක්තනිකාය*, (2006). දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

*දීඝනිකාය*, (2006). දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

### ද්විතීයික මූලාශ්‍රය

අත්තනායක, බී. (2007). *බෞද්ධයාගේ ජීවිත කළමනාකරණය*, දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය,

අබේපාල, ආර්. (2018). *වැඩිහිටි මනෝ විද්‍යාව*. කොට්ටාව: සාර ප්‍රකාශන.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව. (2000). *ශ්‍රී ලංකාවේ ඉහළ යන වැඩිහිටි ජනගහනය*. බත්තරමුල්ල.

ජයතුංග, එම්. ආර්. (2003). *ප්‍රතිකාරාත්මක උපදේශනය*. මුල්ලේරියාව: විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය.

ප්‍රියදර්ශන, ඩබ්ලිව්. (2016). 'වෘද්ධත්ව කළමනාකරණය', *නිවන් මග, 47 කලාපය*. කොළඹ: රජයේ

මුද්‍රණාලයීය බෞද්ධ සංගමය.

රාහුල හිමි, බී. (2020). *බෞද්ධ කළමනාකරණ සංකල්පය*. මරදාන: ස්ටාර් පබ්ලිකේෂන්.